teejay

# සෞඛ්‍ය හා වෘත්තීය සුරක්ෂිතතා ප්‍රතිපත්තිය

ටීජේ ලංකා පොදු සමාගම ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම හා කීර්තිමත්ම රෙදිපිළි නිෂ්පාදන ආයතනයකි. ආයතනය තුල සේවය කරන සියලු දෙනා මෙන්ම ආයතනය හා ඍජුව සම්බන්ධව සේවා සැපයීමේ කාර්යයෙහි යෙදෙන සියලුදෙනාගේ සුරක්ෂිතතාව හා සෞඛ්‍යාරක්ෂාව අපගේ ප්‍රමුඛතාවයක් වේ. එම අරමුණු ඉටු කරගැනීම සඳහා පහත කරුණු වෙනුවෙන් අප කැපවී ක්‍රියාකරමු.

1. ISO 45001:2018 සෞඛ්‍ය හා වෘත්තීය සුරක්ෂිතතා කළමනාකරණ පද්ධතිය ආයතනයේ සන්ධර්භයට අනුකූලවෙමින් පවත්වාගෙන යාම හා එම ක්‍රියාවලිය නිරන්තරව වැඩිදියුණු කිරීම.

2. අවධානම් තත්ව හඳුනාගැනීම, අවධානම තක්සේරු කිරීම හා නිසි ක්‍රියාමාර්ග ගැනීම මගින් ආයතනයේ හෝ ආයතනය වෙනුවෙන් සේවයකරන සියලුදෙනා අනතුරු හෝ රෝගී තත්වයන්ට පත්වීමෙන් වලක්වා ගැනීම.

3. සෞඛ්‍ය හා වෘත්තීය සුරක්ෂිතතාව සම්බන්ධව ඇති ප්‍රතිපත්ති, ක්‍රියාපිළිවෙත් හා වැඩ නියෝග සම්බන්ධයෙන් නිරන්තරව අදාල පුද්ගලයන් දැනුවත් කිරීම.

4. ආයතනයට වලංගු වන නීතිමය තත්වයන් වලට පූර්ණ අවනත භාවයකින් ක්‍රියාකිරීම.

5. සෞඛ්‍ය හා වෘත්තීය සුරක්ෂිතතාව සඳහා ඇති අරමුණු හා ඉලක්ක නිරන්තර සමාලෝචනය හා ඒ සම්බන්ධව ආයතනයේ සාමාජික සාමාජිකාවන් ඇතුලු අනෙකුත් ඇල්මැති පාර්ශව දැනුවත් කිරීම.

6. ඵලදායී සෞඛ්‍ය හා වෘත්තීය සුරක්ෂිතතා කළමනාකරණ පද්ධතියක් පවත්වාගෙන යාමට අවශ්‍ය සම්පත් සම්පාදනය කිරීම හා සාමාජික සාමාජිකාවන්ගේ අදහස් හා සහභාගිත්වය එහි ප්‍රගමනයට යොදාගැනීම.

ආයතනයේ සියලුම මට්ටම් වල සාමාජික සාමාජිකාවන් හා අනෙකුත් ඇල්මැති පාර්ශව දැනුවත් වන පරිදි මෙම ප්‍රතිපත්තිය සන්නිවේදනය කරනු ලබන අතර එය මනාව අවබෝධ කරගෙන ඒ අනුව ක්‍රියාත්මක වීමටත් අවශ්‍ය අවස්ථාවන්හිදී විමර්ශනය කිරීම මගින් මෙම ප්‍රතිපත්තියේ යෝග්‍යතාවය ඇගයීමටත් අප විසින් කැපවී සිටිමු.

**පුබුදු ද සිල්වා**

**ප්‍රධාන විධායක නිලධාරී**

Revision No- 02

Date- 02/04/2021